Rathnayake, R.M.P. Subashini Menike
PAPER

# ප්‍රේම්චන්ද්ගේ නවකතාවල සමාජ, ආර්ථික හා දේශපාලනික අර්බුද පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් {ගෝදාන් රංග්භූමි හා සේවාසදන් ඇසුරෙන්š

R.M.P. Subashini Menike Rathnayake, Department of Hindi, University of Kelaniya

හින්දී සාහිත්‍යයෙහි නවකතා අධිරාජයා ලෙස විරුදාවලියලත් ප්‍රේම්චන්ද් සහ ඔහුගේ සාහිත්‍යය තරම් විමර්ශනයට ලක් වූ සාහිත්‍යකරුවෙක් හෝ සාහිත්‍යයක් නොමැතිත තරම්ය. හින්දී නවකතාවට ප්‍රථම වරට සමාජීක මුහුණුවර ලබාදීමල ප්‍රඥාමය මාධ්‍යයක් බවට හින්දී නවකතාව පත්කර ගැනීම හා සශක්ත ගද්‍ය ශෛලියක් නිර්මාණය කිරීම හේතුවෙන් ප්‍රේම්චන්දයන්ගේ නවකතා හින්දී නවකතා විකාශනයේ සංධිස්ථාන බවට පත්ව ඇත. ප්‍රේම්චන්ද් සේම ඔහුගේ සාහිත්‍යය ද හින්දී ක්ෂේත්‍රයෙහි පමණක් නොව විශ්ව සාහිත්‍යය තුළ ද අමරණීයත්වයට හා අද්විතීයත්වයට පත් කෙරෙන විවිධ වටිනාකම් රැසකින් ඔහුගේ නවකතා සමන්විත වෙයි.

ප්‍රේම්චන්ද්ගේ නවකතා සාහිත්‍යයෙහි සමස්ත අවකාශය වෙන්වී ඇත්තේල භාරතීය ජන සමාජයේ සමාජ, ආර්ථිකල දේශපාලන හා සංස්කෘතික මූල මණ්ඩලවලින් ජනිත විවිධ අර්බුද හා විකෘතිතා විදාරණය කිරීම සඳහාය. ප්‍රේම්චන්ද සාහිත්‍යකරණයට පිවිසෙන්නේ අධිරාජ්‍යයවාදී යදම් වලට භාරතය හසුවූ යුගයකදීය. යටත් විජිත බැමි, ධනේශ්වර සමාජක්‍රමයෙන් සංත්‍රස්ත මානව හා සමාජ බන්ධන, වැඩවසම් අගතීන්ගෙන් ජනිත ළමා විවාහ, සති පූජාව, වෛශ්‍යා වෘත්තිය වැනි සමාජ විකෘතිතා සහ ආර්ථික ක්‍රමය විසින් පවත්වාගෙන යනු ලබන ජනතාවගේ සූරාකෑම, පීඩාව, දරිද්‍රතාව ආදී ආර්ථික හා දේශපාලන අර්බුද ප්‍රේම්චන්දයන්ගේ නවකතාවල ප්‍රධාන අක්ෂය බවට පත්වී ඇත.

ප්‍රේම්චන්ද් සාහිත්‍යය කියවීමකින් තොරව භාරතය හෝ භාරතීය ජන ජීවිතය හඳුනාගත නොහැකි බව විචාරක මතයයි. ලෝකයේ ඕනෑම සාහිත්‍යකරුවෙක් කිසියම් රටකට භාෂාවකට පමණක් සීමා නොවන අතර ඔහු තම යුගයේ භෞතික සංස්ථිතිවල සහ සමකාලීන සමාජයේ ඓතිහාසික ශක්තීන් ගේ නිර්මාණයක් ද වේ. එබැවින් ප්‍රේම්චන්ද්ගේ නවකතාවල සමාජ, ආර්ථික, දේශපාලන අර්බුද පිළිබඳ අධ්‍යයනය ජාතික වශයෙන් පමණක් නොව අන්තර්ජාතික වශයෙන්ද ඉමහත් ඵලදායිතාවයකින් සමන්විත ප්‍රයත්නයකි. ප්‍රේම්චන්ද්ගේ නවකතාවල සාකච්ඡා කරන අර්බුද මොනවාද යන්න හඳුනාගෙන ඒවා නිර්මාණය වීමට හේතු සහ ඒවා විසඳීමට ලේඛකයා ගත් උත්සාහය විද්වත් ලෝකය හමුවේ අනාවරණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වෙයි. ප්‍රේම්චන්ද්යන්ගේ විශිෂ්ට නවකතා තුනක් වන ගෝදාන්, රංග්භූමි, හා සේවාසදන් මෙහිදී ඍජු අවධානයට යොමු කෙරේ.

මුඛ්‍ය පද : ප්‍රේම්චන්ද්, ගෝදාන් , රංග්භූමි, සේවාසදන්, යටත් විජිත බැමි